පුලුවන්නෙ.. නැත්නම් ඉතින් මොන එකකටද සල්ලි වියදම් කරලා එයාලව ගෙන්නන්නෙ..''

ඔහු බොහෝ දිග කල්පනාවකට වැටී සිටිනු ඈ දුටුවා ය. කල්පනා කරන්නට බොහෝ දේ ඔහුට තිබුණි. අනුරාධ එන බව නිසැකවම නිෂාධි දැන සිටිනු ඇත. ඇය ඔහු හමු වනු ඇත. එය වැළැක්විය යුතු ය. එසේ කිරීමේ හැකියාවක් තිබේ ද?

''කවද ද ෆිල්ම් එක..?'' ඔහු ඇසුවේ ය.

''ළබන මාසෙ විසිපස්වෙනි දා.. දැනටම ටිකට්ස් බාගයක් විතර ඉවරයි ලු.. ලංකාවෙත් හොඳට දුවන ෆිල්ම් එකක්නෙ.. බලනවා නම් දැන්ම ටිකට්ස් ගන්න වෙයි'' නිෂාධි අවසාන වාක්‍යය කීවේ දිලීප රිදවන අදහසින්ම ය. සිය හැඟීම් සඟවාගෙන සිටින්නට උත්සාහ ගන්නා මේ මිනිසා ගේ මුහුණේ ඉරියව් වෙනස් වන ආකාරය නිරීක්ෂණය කරන්නට සියුම් අවශ්‍යතාවක් ඇගේ සිතේ ඇතිව තිබුණි. ''ගෑනි නිසා මේ මනුස්සයා අපරාදෙ දුක් විඳිනවා..'' ඈ සිතුවා ය.

''හැඟීම් හංගගෙන ඉන්න මිනිස්සු තමයි වැඩියෙන්ම දුක් විඳින්නෙ.. දුක හිතුනාම අඬන්න ඕනෙ.. එතකොට තමයි හිත සන්සුන් වෙන්නෙ.. සතුටක් දැනුණාම හිනාවෙන්න ඕනෙ.. හිත සැහැල්ලු වෙන්න.. හිනාවෙන්නවත් අඬන්නවත් දන්නෙ නැති බුම්මට්ටෙක් කියන්නෙ හිතේ ඔක්කොම හිරකරගෙන දුක් විඳින අවාසනාවන්ත මනුස්සයෙක් කියන එකයි''

000000000000000000000

විදෙස් සංචාර අනුරාධට නුපුරුදු දෙයක් නොවේ. මෙයට පෙර කීප වතාවක්ම ඔහු විවිධ සිනමා පට සමගින් යුරෝපයටද එංගලන්තයටද ගොස් තිබුණි. එනමුදු මේ ගමන ඒ සියල්ලටම වඩා විශේෂිත ය. මෙය හුදු සිනමා පටයක් විදේශයක ප්‍රදර්ශනය කිරීම උදෙසා යන ගමනක් නොවේ.

තමා ඔස්ට්‍රේලියානු සංචාරයකට පැමිණෙන බව නිෂාධිට දැන් වූ මොහොතේ ඇය සතුටු වූ ආකාරය ඔහුට සිහිපත් විය.

මල් වැස්ස සිනමාපටය මෙල්බන් හි ප්‍රදර්ශනය කරන්නට සැළසුම් කෙරෙමින් තිබෙන බව ඇය උදාරි වෙතින් දැන සිටියා ය. සිනමාපටය සමඟින් තමාද පැමිණෙන බව අනුරාධ දුරකතනයෙන් දැන් වූ මොහොතේ ඇයට එය අදහා ගත නොහැකි තරමේ සතුටුදායක ආරංචියක් විය. අනුරාධ සිටියේද මහත් සතුටකින් බව ඇයට වැටහුණි.

''හැම දෙයක්ම අපි නොහිතන විදිහට සිදුවෙනවා නිෂා..'' අනුරාධ කීවේ ඒ සතුට නිසා ය. ''යමක් වෙන්න තියෙනවා.. ඒක වළක්වන්න කාටවත් බැහැ..''

අවශ්‍යකරන සියලුම විස්තර නිෂාධි අනුරාධ වෙතින් ලබා ගත්තා ය. සංවිධායකයින් ගේ දුරකතන අංක සහ ලිපින ඈ ප්‍රවේසමින් ලියා ගත්තා ය.

''මේක ඕගනයිස් කරන අය කැමති නැහැ අපි තනිවම එළියට යනවට.. ඒක ගැන දැන්මම අපේ ඩිරෙක්ටර්ට ඒ අය කියලා තියෙනවා. ඒත් මම කොහොම හරි ඔයා හමුවෙනවා නිෂා..'' අනුරාධ කීවේ ය.

''මං අහලා තියෙනවා ඒ ගැන.. ෂෝස් ඕගනයිස් කරන හුඟක් අය එහෙමයි ලු.. ඒ අය බයයි මෙහෙට එන ආටිස්ට් ලා පැනලා යයි කියලා.. එහෙම හොරෙන් පනින අයත් ඉන්නවනේ.. ''

''ඒකට කමක් නැහැ.. අඩුම ගානෙ ඒ මිනිස්සු නිසා මට ඔස්ට්‍රේලියාවට එන්න ඉඩක්වත් ලැබෙනවනෙ..''

*නුඹ නොදුටු නිමේෂය*
*කල්පයක් සේ ගෙවුණි*
*නුඹෙ සුවඳ තව තවත්*
*හදවතේ පොදි බැඳුණි*
*සුබ සිහින මාලිගා*
*සැබෑ වන ලොව දුටිමි*
*කප්පරක් පැතුම් ගෙන*
*නුඹ සොයා මම ඇදෙමි*

''මොනාද කල්පනා කරන්නෙ..'' අනුරාධගේ අසුනට යාබද අසුණේ වාඩි වී සිටි මනීෂා ඇසුවා ය.

''මොකුත් නෑ..'' ඔහු කීවේ ය.

''බොරුකාරයා..'' ඈ සිනාසුණා ය. ''.. දැන් තොරණක් එහෙම ගහලා ලෑස්ති වෙලා ඇති නේද පිලිගන්න..?''
''කවුද..?''
''කවුද කියලත් අහනවා.. අනේ කමක් නෑ.. නයෙක් පොළඟෙක් කාලා හරි කාට හරි හරි යනවා නම්..''

අනුරාධ  නැවත කල්පනාවට වැටුණේ ය.

''ඔය හැටි කල්පනා කරන්න එපා.. එයා හමුවෙන්න ලැබෙයි.. අපිත් පුලුවන් උදව්වක් කරන්නංකෝ.. ''

00000000000000

''මං රිසර්ච් එකකට ළබන  මාසෙ මුළ ටැස්මේනියා යනවා..'' දිලීප කාමරයට යන අතර නිෂාධි දෙස බලා කීවේ ය. ඈ සිටියේ සාලයේ දිග සෝපාවේ ඇළවී ගත් වනම සඟරාවක් කියවමිනි. ඇය බොහෝ සතුටින් සිටින්නේ යයි දිලීප ට සිතුනි. සියුම් කෝපයක් සිය සිත තුළ මතුව එනු ඔහුට දනුණි.
''ඔයාටත් මා එක්ක යන්න වෙනවා..''

ඈ ඔහු දෙස බැලුවේ විස්මයෙනි. අනුරාධගේ ඔස්ට්‍රේලියා ගමන ඔහු දැනගත්තේ ද?

''මම ටිකට්ස් බුක් කළා.. මේ කාලෙට ටැස්මේනියාව බලන්න ලස්සනයි.. ෂුවර් එකටම ඔයා ආසා වෙයි'' ඔහුගේ කතාව ඇගේ සිතේ ඇති කළේ කෝපයකි. මේ අධිකාරිවාදී හැසිරීම තව කොපමණ කාලයක් ඉවසා සිටින්න ද?

''ඇයි මගෙන් අහන්නැතිව මට ටිකට්ස් බුක් කළේ..''

''ඔයාට ඉතින් ගෙදර ඉඳන් කරන්න වෙන වැඩක් තියෙන එකක්යැ.. ඇරත් මං හිතුවා ඔයා ආසා වෙයි කියලා.. පොඩි චේන්ජ් එකකටත් එක්ක.. ඔයාටත් එපා වෙලා ඇතිනෙ මේ තෙදර ඇතුළටම වෙලා ඉඳලා'' ඔහු ඇය ඉදිරියේ වූ අසුනෙහි වාඩි වන අතර කීවේ ය.

''ඔයා යන්න.. මං එන්නෙ නෑ..'' ඈ තදින් කීවා ය. ''අදම බුකිං එක කැන්සල් කරන්න..''

ඔහුගේ මුහණ කෝපයෙන් කළු වනු ඈ නිරීක්ෂණය කළා ය. ඈ එය නොදුටුවා සේ සිය ඇස් පොතට යොමු කළා ය. ඔහු ටික වේලාවක් නිශ්ෂබ්දව සිටියේ ය. සිය කෝපය පාලනය කරගන්නට ඔහු ඒ වේලාව යොදා ගත්තේ ය.
''ඔයාට එන්නම වෙනවා.. මට බැහැ ඔයාව තනියම මේ ගෙදර තියලා යන්න.'' ඔහු සන්සුන් ලෙස කීවේ ය.

''මට බල කරන්න එපා.. ඒකෙන් වෙන දෙයක් නැහැ.. ඔයාට යන්න අවශ්‍ය ගමනක් තියෙනවා නම් ඔයා ඒක යන්න.. මා ගැන කරදර වෙන්න එපා.. කරුණාකරලා මට මගේ පාඩුවේ ඉන්න දෙන්න..'' නිෂාධි කීවේ කෝපයෙනි. ඈ වාඩි වී සිටි තැනින් නැගිට්ටේ කාමරයට යන්නටය. මේ කතාව මෙතැනින්නම නතර කරනන්ට ඇයට අවශ්‍ය විය.

ඔහු ද ඈ අනුවම නැගිට්ටේ ය.

''ඔහොම ඉඳ ගන්න.. මට කතා කරන්න ඕනෙ..''  ඔහු කීවේ විධානයක් කරන ආකාරයෙනි. ඈ අවඥාවෙන් සිනාසුණා ය. ඔහ ඇගේ මඟ හරස් කළේ ය. ඈ කිසිසේත්ම බලාපොරොත් නොවූ ලෙස ඔහු එකවරම ඈ තරයේ වැළඳ ගත්තේ ය. දැඩි අඬුවකට හසුව ගත් කළෙක මෙන් ඔහුගේ දෑතේ සිරවී සිටි ඈ එයින් ගැළවෙන්නට අසාර්ථක උත්සාහයක යෙදුණා ය.

''මට ඔයා ඕනෙ නිෂාධි..'' ඔහුගේ කටහඬ ඇයට සිය කන අසළින්ම ඇසුණි. ඈ මහත් අපුලකින් හිස පසෙකට හරවා ගත් වන ම

24 වන පිටට

